# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - 13 ඒකකය

1.පහත සියල්ල අතරින් එකක් පමණක් biometrics ගණයට නොගැනේ.එය කුමක්ද?

1. ඇඟිලි සලකුණු
2.මුරපද
3.හඬ
4.මුහුණේ ප්‍රකාශන
5.Retina

2.විවෘත හා ගතික පරිසරයන්ගේ ස්වයංක්‍රීය ගැටළු විසඳුම් වස්තූන් මගින් සිදු කරනු ලබන ඵලදායී ගණනය කිරීම් හා මෙහෙයුම් හඳුන්වනු ලබන්නේ,

1.පරිණාමවාදී පරිගණකය
2.සර්වත්‍රික පරිගණකය
3.ක්වන්ටම් පරිගණකය
4.වොන් නියුමාන් සංකල්පය
5.කාරක තාක්ෂණවේදය

3.යම්කිසි පරිසර තත්ත්වයකදී අන්‍යොන්‍ය ක්‍රියාකාරීත්වයකින් යුත් නියෝජිතයින් කිහිපයකින් සමන්විත පරිගණක පද්ධතියක් හැඳින්වීමට යොදා ගන්නේ,

1.බහු නියෝජිත
2.ස්නායුක ජාල ( Nural Network)
3.ඒක නියෝජිත
4.ජාන ප්‍රවේණි ඇල්ගොරිත( Generic Algorithm)
5.විශේෂඥ පද්ධති ( Expert System)

4.නියෝජිත තාක්ෂණයේ ප්‍රධාන ගුණාංගයක් නොවන්නේ,

1.ටූරිං පරීක්ෂාවෙන් සමත් විය යුතුය.
2.බුද්ධිමත් බව
3.ස්වයංව ක්‍රියාකිරීමේ හැකියාව
4.නියෝජිතයන් අතර තරඟකාරීව කටයුතු කිරීම.
5.ගතික පරිසරයක වැඩ කිරීම.

5.ගැළපෙන පරිදි ආකෘති පත්‍ර පිරවීම සඳහා නිර්මාණය කර ඇති නියෝජිත වර්ගයකි.

1.ව්‍යාප්ති නියෝජිතයන්
2.බහු නියෝජිතයන්

3.ජංගම නියෝජිතයන්
4.පරිශීලක නියෝජිතයන්
5.බුද්ධිමත් නියෝජිතයන්

6.නියෝජිතයෙකුගේ වෙබ් අවකාශයේ තෝරා ගත් කොටස් හෝ තොරතුරු වෙබ් අවකාශය සුපරීක්ෂණය කරමින් ක්‍රියාත්මක වන සේවාදායක පරිගණක මත පදනම් වූ වැඩසටහනක් හැඳින්වෙන්නේ කවර නමකින්ද?

1.වෙබ් අතරික්සුව ( Web Browser)
2.වෙබ් බඩගාන්නා (Web Crawler)
3.කන්සෙයි පද්ධති (Kenzie System)
4.භාවාත්මක පරිගණක(Emotional Computers)
5.රොබෝ යන්ත්‍ර (Robotics)

7.ආලෝකකරණය,උෂ්ණත්වය,විනෝදාස්වාද පද්ධති හා උපකරණ පාලනය කරන සුහුරු නිවෙස් යෙදුමක් ( Smart Home Application) පහත කවරකට උදාහරණ වේද?

1.පරිණාමික පරිගණනය (Evolutionary Computing)
2.බහු ඒජන්ත පද්ධති (Multi – Agent Systems)
3.ස්වභාව ධර්මයෙන් අනුප්‍රාණිත පරිගණනය ( Nature – Inspired computing)
4.මෘදුකාංග ඒජන්ත (Software Agents)
5.සාර්වත්‍රික පරිගණනය( Ubiquitous Computing)

8.කෘතිම බුද්ධිය( Artificial Intelligence) සම්බන්ධ පහත ප්‍රකාශ සලකන්න.
A - අයාචිත තැපැල් ( Spam) පෙරහන් තුළ කෘතීම බුද්ධි පද්ධති භාවිත කළ හැකිය.
B - කෘතීම බුද්ධි පද්ධතිවලට අවිනිශ්චිත තොරතුරු විශ්ලේෂණය කිරීමේ හැකියාව ඇත.
C - කෘතීම බුද්ධි පද්ධතියක් යනු පෘථිවි පෘෂ්ඨයෙහි යම් යම් ස්ථානවලට සම්බන්ධ දත්ත අත්පත් කර ගැනීම,ගබඩා කිරීම,සැකසීම හා ප්‍රදර්ශනය කිරීම සඳහා වන පද්ධතියකි.
ඉහත කවරක් නිවැරදි වේද?

1. A පමණි.
2. A හා B පමණි.
3. A හා C පමණි.
4. B හා C පමණි.
5. A,B හා C සියල්ලම.

9.පහත දෑ සලකන්න.
A - අහසෙහි වළාකුළු ඇතිවීම.
B - ජීවීන්ගේ පරිණාමය

C - මිනිස් මොළයේ නියුරෝන ක්‍රියාකාරිත්වය

ජෛව ප්‍රේරිත පරිගණනය( Bio – Inspired Computing) සඳහා ඉහත කවරක් භාවිත කළ හැකිද?

1. A පමණි.
2. B පමණි.
3. A හා C පමණි.
4. C පමණි.
5. B හා C පමණි.

10.ක්වොන්ටම් පරිගණනය( Quantum Computing) සම්බන්ධයෙන් කවරක් නිවැරදි වේද?

A - ක්වොන්ටම් පරිගණනයේදී ක්වොන්ටම් භෞතික විද්‍යාවේ මූලධර්ම යෙදවේ.
B - ක්වොන්ටම් පරිගණනයේදී තොරතුරු ඒකකය ලෙස ක්වොන්ටම් බිටු( Qubits) භාවිත වේ.
C - ක්වොන්ටම් පරිගණක මනුෂ්‍ය පරිශීලකයන්ට අහිතකර විකිරණ පිට කරයි.

1. A පමණි.
2. B පමණි.
3. C පමණි.
4. A සහ B පමණි.
5. A,B සහ C සියල්ල.

**පිළිතුරු**

| | |
|---|---|
| 1.) 4 | 6.) 2 |
| 2.) 3 | 7.) 5 |
| 3.) 1 | 8.) 2 |
| 4.) 1 | 9.) 5 |
| 5.) 4 | 10.) 4 |

**සකස් කළේ -**

**එච්.ටී.පී.රණතුංග මිය,**
**ර/කිරිඇල්ල ම.ම.වි.**